# ශ්‍රී ලංකාවේ කුලී රථ කර්මාන්තයේ මානව සම්පත් උපයෝජනය පිළිබඳ සමීක්ෂණය - 2018

## 1 පරිච්ඡේදය

### 1-1. හැඳින්වීම

ලෝකයේ සෑම රටකම ආර්ථිකය රඳාපවතින තීරණාත්මක සාධක අතර, එම රටෙහි පවතින ශ්‍රම වෙළඳපොළ ඉතා වැදගත් ස්ථානයක් හිමිකර ගනී. එබැවින් ශ්‍රම වෙළඳපොළ පිළිබඳ නිවැරදි සහ යාවත්කාලීන තොරතුරු සමාජය වෙත ගලා ඒම තුලින් රටේ ආර්ථිකය වඩාත් ශක්තිමත් කිරීමට ඉඩ ප්‍රස්ථාව සැලසේ.

ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ (International Labour Organization) විග්‍රහයන්ට අනුව ශ්‍රම වෙළඳපොල තොරතුරු යනු ශ්‍රම වෙළඳපොළ සංයුතිය, එහි ප්‍රමාණය, ක්‍රියාකාරීත්වය, ඒ තුල උද්ගතවන ගැටළුකාරී තත්වයන් මෙන්ම නිර්මාණයවන රැකියා අවස්ථාවන් පිළිබඳව ජනනයවනකාලීන තොරතුරු වේ.

ඒ අනුව කාලෝචිත, නිවැරදි සහ පරිපූර්ණ ශ්‍රම වෙළඳපොළ තොරතුරු මගින් රැකියා නියුක්තිකයන්, රැකියා වියුක්තිකයන්, සේව්‍යයන්, ස්වයං රැකියාවල යෙදෙන්නන්, රජයේ සහ ජාතික ප්‍රතිපත්ති සම්පාදනයට දායක වන්නන්හට තීරණ ගැනීමේදී සහය ලබා දෙනු ලැබේ. එම නිසා රටක ශ්‍රම වෙළඳපොළ තොරතුරු කාලීනව විශ්ලේෂණය කිරීම සහ එම තොරතුරු සම්බන්ධයෙන් අදාල පාර්ශවයන් වෙත පුළුල් ප්‍රවේශයක් ඇති කිරීම රටේ ආර්ථික සංවර්ධනය සඳහා ස්ථිර සාධකයක් වේ.

ශ්‍රී ලංකාවේ ශ්‍රම වෙළඳපොළ තොරතුරු එක් රැස් කිරීම, විශ්ලේෂණය කිරීම සහ තොරතුරු බෙදා හැරීම සඳහා මිනිස්බල හා රැකී රක්ෂා දෙපාර්තමේන්තුව යටතේ ශ්‍රම වෙළඳපොළ තොරතුරු ඒකකය පිහිටුවන ලදි. එමගින් වාර්ෂිකව සිදු කරනු ලබන සමීක්ෂණ හා අධ්‍යයනයන් ඇසුරින් සකස් කරනු ලබන ශ්‍රම වෙළඳපොළ තොරතුරු වාර්ෂික ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවිය මඟින් ප්‍රකාශයට පත්කරනු ලබයි.

ඒ අනුව ආර්ථික සංවර්ධනය සඳහා දායකත්වයක් ලබා දීමේ ශක්‍යතාවයක් සහිත මෙන්ම නව රැකියා අවස්ථා බිහි කිරීමේ හැකියාවක් සහිත බවට හඳුනාගත් කුලී රථ කර්මාන්තයේ මානව සම්පත් උපයෝජනය පිළිබඳ සමීක්ෂණයක් සිදුකරන ලදි. ශ්‍රී ලංකාවේ නව ප්‍රවණතාවක් ලෙස කුලී රථ කර්මාන්තය නාගරික, අර්ධ නාගරික මෙන්ම ගම්බද ප්‍රදේශවලද ශීඝ්‍රයෙන් ව්‍යාප්ත වෙමින් පවතින අතර මෙහිදී මූලික අවධානය යොමු වූයේ ශ්‍රී ලංකාවේ කුලී රථ කර්මාන්තයේ රැකියා අවස්ථාවන් පිළිබඳවත් ඒ ඒ රැකියා සඳහා අවශ්‍ය අධ්‍යාපන, වෘත්තීය සුදුසුකම් සහ

කුසලතා පිළිබඳවත්, එම රැකියා අවස්ථාවන්හි සේවා තත්ත්වයන්, වැටුප් ඇතුළු ප්‍රතිලාභ සහ වෘත්තීය සංවර්ධන දිශානතීන් පිළිබඳවත් අධ්‍යනය කිරීමයි.

ඒ අනුව කුලී රථ කර්මාන්තය තුල රැකියා සොයන්නන්ට, වෘත්තීය මාර්ගෝපදේශනය ලබා දෙන උපදේශකයින්ට, ප්‍රතිපත්ති සම්පාදකයින්ට සහ රැකියා ක්ෂේත්‍රයේ වෙනත් අධ්‍යයනයන් සිදුකරන්නන්ට මෙම අධ්‍යයනය මඟින් රැස්කරන ලද තොරතුරු ප්‍රයෝජනවත් මූලාශ්‍රයක් බවට පත්වනු ඇතැයි අපි අපේක්ෂා කරන්නෙමු.

## 1-2. සාහිත්‍යය විමර්ශනය

මිනිසා නොයෙක් නව නිපැයුම් වලින් තමන්ගේ දෛනික කටයුතු පහසුකර ගැනීමට නිරන්තරයෙන් ගවේශණශීලී වේ. මේ නිසා මිනිසා ව්‍යවහාරික අවශ්‍යතා ඉටුකර ගැනීමේදී ඉතා අඩු කාලයකින් නවීන තාක්ෂණය භාවිතා කර නිමාකර ගැනීමට සමත් වී ඇත. අතීතයේ බක්කි කරත්තෙන් ගමන් කර ක්‍රමයෙන් පරිණාමය වී අදවන විට පොදු ප්‍රවාහන ක්‍රමවේදයෙන්ද ඈත්ව කුලී රථ සේවාව සඳහා යොමු වී තිබේ.

කුලී රථ වශයෙන් අතීතයේ සිට ට්‍රෑම් රථ, රික්ෂෝ, ආදියද වර්තමානයේ ත්‍රී රෝද රථ, කැබ්, මිනිකැබ්, බස් රථ, ලොරි රථ ආදිය ද ප්‍රවාහන කාර්යන් ලෙස යොදාගෙන තිබේ. ශ්‍රී ලංකාවේ වර්තමානයවන විට කුලීරථ සේවාවේදී බහුලව යොදාගනු ලබන කුලීරථය ලෙස ත්‍රී රෝද රථය පෙන්වා දිය හැකිය. කුලී රථ සේවාව තනි පුද්ගල වශයෙන් ආරම්භ වූවද එය කර්මාන්තයක් ලෙස ව්‍යාප්ත වීමත් සමඟ කුලී රථ මෙහෙයවන සමාගම් ලෙස වර්ධනය වී ඇත. එමගින් නොයෙක් වාසි යටතේ පාරිභෝගිකයන්ට තම සේවාව භුක්ති විදීමට හැකියාව ලැබී තිබේ. නවීන තාක්ෂණය භාවිතා කරන ඔවුන් සාම්ප්‍රදායික කුලී රථ රියදුරන්ට ද අභියෝගයක් වී තිබේ.

මෙසේ විකාශණය වෙමින් පැවත එන කුලී රථ කර්මාන්තය වර්ධනය වීමත් සමඟ ක්ෂේත්‍රයේ සිදු වූ විවිධ පරිණාමයන් හේතු කොටගෙන ඒ පිළිබඳ සමීක්ෂණ අධ්‍යයන සහ ගවේශනයන් විවිධ රටවලින් සිදුකරන ලදි. ඒ අතර International Labour Organization විසින් දකුණු අප්‍රිකාවේ අත්දැකීම් මූලික කර ගනිමින් සමීක්ෂණයක් The South African Experience නමින් සිදුකර ඇත. මෙහිදී 2001 වර්ෂයේදී දකුණු අප්‍රිකාවේ අවිධිමත් ක්ෂේත්‍රයේ සංවිධානයන් පිළිබඳව අවධානය යොමු කර ඇත. ඒ අනුව මෙහිදී ක්ෂේත්‍ර 04ක් පිළිබඳ අවධානය යොමු කර ඇති අතර Kombi Taxi, ඇඟළුම්, ඉදිකිරීම් හා වීදි වෙළදාම යන අංශ මේ සඳහා පාදක කරගෙන ඇත. මේ අතරින් Kombi Taxi කර්මාන්තය තෝරාගෙන ඇත්තේ 2001 වසර සිට පසුගිය වසර 15 තුළ සීඝ්‍රයෙන් දියුණු වූ සංවිධානාත්මක ව්‍යාපාරයක් වීම හා අඩු ආදායම් ලාභීන් වූ කළු ජාතික ප්‍රජාවගේ ජනප්‍රිය ප්‍රවාහන මාදිලිය වීමය. මෙමඟින් Taxi කර්මාන්තයේ ඉතිහාසය හා ආර්ථිකය, එහි කාර්යන්, Taxi

කර්මාන්තයේ යෙදෙන්නන්, ඔවුන්ගේ වැටුප් හා තත්වයන් කවරේද යන්න පිළිබඳව අධ්‍යයනය කිරීම සඳහා අවධානය යොමුකර ඇත.

එසේම Economics of the Taxi Industry An Uber Shake – Up යනුවෙන් සමීක්ෂණයක් එක්සත් ජනපදයේ Wyoming විශ්ව විද්‍යාලයේ උපාධි අපේක්ෂකයෙකුවන ස්ටීවන් රෙහෙල් නැමැත්තා විසින් සිදුකර ඇත. ලෝකය පුරා නගරයන්හි ආක්‍රමණික කර්මාන්තයක් ලෙස Taxi කර්මාන්තය ප්‍රචලිත වීමත් සමඟ කුලී රථයන්හි අධික සැපයුම මත රජය විසින් නීතිරීති පැනවීමට ක්‍රියාකර තිබේ. මෙම සමීක්ෂණය ගාස්තු ස්ථාවර කිරීම, ආරක්ෂාව හා කුලී රථවල ගුණාත්මක බව වැඩිදියුණු කිරීම, රියදුරන්ගේ ශ්‍රමයට සරිලන වැටුපක් ලබා දීම ආදි කරුණු කීපයක් මූලික අරමුණු කරගෙන සිදුකර තිබේ.

Australian National University හි මහාචාර්ය Des Nicholls විසින් Australian Taxi Industry Association සඳහා Competition and Regulation – Current Trends in the Taxi Industry යනුවෙන් සමීක්ෂණයක් සිදු කර ඇත. මෙමගින් රටවල් ගණනාවක ටැක්සි වෙළඳපොලවල් පාලනය කරන නියාමන රෙගුලාසි සංසංදනය කොට ඒවා විශ්ලේශනය කර ඉදිරිපත් කිරීමක් සිදුකර ඇත. ඒ අනුව Netherlands, Sweden, Norway, New Zealand, United States යන රටවල් මේ සඳහා උපයෝගී කොරගෙන ඇති අතර 2003 වර්ෂයේ මෙහි අවසන් වාර්තාව එළි දැක්විය. කුලී රථ බලපත් සංඛ්‍යාව සීමා කරන රෙගුලාසි, තරඟකාරිත්වය සහ වෙනත් පාරිභෝගික ගැටළු හඳුනා ගැනීම ඇතුළුව තවත් සුවිශේශී කරුණු ගණනාවක් මෙයට ඇතුලත් විය. කුලී රථ කර්මාන්තය තුල වෙළඳපොළ පාලක බලපෑම් පිළිබඳ අන්තර්ජාතික සැසඳීමක් පිළිබඳ වාර්තාවක් ලෙසද මෙය හැදින්විය හැකිය.

කුලී රථ කර්මාන්තය පිළිබඳ විවිධ රටවලින් මෙවැනි අධ්‍යයනයන් සිදු කර තිබුණද ශ්‍රී ලංකාවේ කුලී රථ කර්මාන්තයේ මානව සම්පත් උපයෝජනය සහ එමගින් ශ්‍රම වෙළඳපොළ තුල පවතින රැකියා අවස්ථාවන් පිළිබඳව හදුනා ගැනීම සම්බන්ධව සමීක්ෂණයක් සිදුකර නොමැති වීම හේතුවන් ඒ පිළිබඳ මෙම සමීක්ෂණය සිදු කිරීමට කටයුතු කරන ලදි.

## 1-3. අරමුණු

- කුලී රථ කර්මාන්තයේ රැකියා අවස්ථාවන් පිළිබඳව අධ්‍යයනය කිරීම සහ එම රැකියා අවස්ථාවන් සඳහා යොමු වීමට අවශ්‍ය නිපුණතාවන් හා සුදුසුකම් සකස් කර ගත යුතු ආකාරය පිළිබඳව අධ්‍යනය කිරීම.
- එම ක්ෂේත්‍රයේ රැකියා සඳහා යොමු වී ඇති පිරිසගේ සේවා තත්වයන් පිළිබඳ අධ්‍යනය කිරීම. (ප්‍රතිලාභ, වැඩ කරන පැය ගණන,වයස, ස්ථිර/තාවකාලික ආදිය)

## 1-4. ගැටළුව

වර්තමානය වන විට නාගරික අර්ධ නාගරික මෙන්ම ගම්බද ප්‍රදේශවලද ප්‍රවාහනය මූලික අවශ්‍යතාවයක් බවට පත්ව තිබේ. මෙම අවශ්‍යතා පොදු ප්‍රවාහන මාධ්‍ය භාවිතයෙන් සපුරා ගැනීමේදී සිදුවන නොයෙකුත් අපහසුතා මෙන්ම සුවපහසු, කාර්යක්ෂම හා විශ්වාසනීය ගමන් අවශ්‍යතා සපුරා ගැනීමේ අරමුණ හේතුවෙන්, මේ වන විට ශ්‍රී ලංකාවේ කුලී රථ කර්මාන්තය ජනප්‍රිය ප්‍රවාහන මාධ්‍යක් බවට පත් වී තිබේ.

කුලී රථ කර්මාන්තය සුවසහසු හා කාර්යක්ෂම ප්‍රවාහන මාධ්‍යක් ලෙස වැඩි දියුණු වීමත් සමඟ ලංකාවේ කුලී රථ ප්‍රමාණය ක්‍රමයෙන් වැඩිවෙමින් පවතී. ක්‍රමයෙන් වැඩිදියුණුවන කර්මාන්තයක් තුලින් ශ්‍රම වෙළඳපොලට එකතුවන රැකියා අවස්ථාවන් වැඩි විය යුතුය. එසේම වාර්ෂිකව ශ්‍රම වෙළඳපොලට එකතුවන ශ්‍රම බලකායට පවතින රැකියා අවස්ථාවන් පිළිබඳ නිසි අවබොධයක් නොමැති වීම සහ ඒ සඳහා අවශ්‍ය නිපුණතාවයන් හා සුදුසුකම් සපුරා නොමැති වීම හේතුවෙන් එවැනි රැකියා අවස්ථාවන් සඳහා යොමු වීමට ඇති අවස්ථාවන් මඟ හැරී ඇත. එසේම රැකියාවක නියැලීමට කැමැත්තෙන් පසුවන පිරිසටද ඒ සඳහා යොමු වීමට අවශ්‍ය නිපුණතාවන් පිළිබඳ සහ ඒවා ලබා ගැනීමට යොමුවිය යුත්තේ කෙසේද යන්න පිළිබඳ නිසි අවබෝධයක් නොමැත.

## 1-5. සමීක්ෂණ ක්‍රමවේදය

බස්නාහිර පළාත තුළ ලියාපදිංචි කුලී රථ නියෝජිත ආයතන අතුරින් ආයතන 52 ක් නියදිය ලෙස තෝරාගෙන මෙම සමීක්ෂණය සිදුකර ඇත. මෙම සමීක්ෂණය සඳහා තෝරාගත් ආයතන කම්කරු දෙපාර්තමේන්තුවේ සේවක අර්ථසාධක අරමුදල වෙත යොමුකර එහි ලියාපදිංචි වී ඇති ආයතන තෝරාගත් ගන්නා ලද අතර එම ආයතන වලට අමතරව ක්‍රියාකාරී මට්ටමේ පවතින වෙනත් කුලීරථ නියෝජිත ආයතනද මේ සඳහා උපයෝගීකර ගන්නා ලදි.

ඒ අනුව නියැදිය ඉක්මවා ගොස් ආයතන විශාල සංඛ්‍යාවක් සමීක්ෂණය සඳහා යොදා ගැනීමට සිදු විය. එයට හේතුවූයේ බොහෝ නියෝජිත ආයතන ඉතා අඩු සේවක සංඛ්‍යාවකින් යුක්තව හෝ තනි පුද්ගල වශයෙන් පවත්වාගෙන යාමයි. අදාල සමීක්ෂණ අරමුණ කරා මෙම අධ්‍යයනය මෙහෙයවීමට ප්‍රධානතම බාධාවක් වූයේ අධ්‍යයනය සඳහා ප්‍රමාණවත් දත්ත නොලැබීම හා ආයතන විශාල සංඛ්‍යාවක් තොරතුරු හා දත්ත ලබාදීම ප්‍රතික්ෂේප කිරීමයි. ඒ අනුව, සමීක්ෂණ සඳහා තොරතුරු ආයතන 24ක් වෙතින් රැස්කර ගන්නා ලදි. එම සීමිත තොරතුරු මත පදනම්ව පහත දැක්වෙන නිරීක්ෂණ ඉදිරිපත් කරනු ලැබේ.

# 2. පරිච්ඡේදය

## 2-1. සමීක්ෂණයට භාජනය වූ ආයතනයන්හි ව්‍යාපාර ක්ෂේත්‍රයන්




රූප සටහන 01 : ව්‍යාපාර ක්ෂේත්‍රය

සමීක්ෂණය සඳහා යොදා ගන්නා ලද කුලී රථ නියෝජිත ආයතන අතරින් 68% ක් ආයතන මඟී ප්‍රවාහනය පමණක් සිදුකරන අතර මඟී හා භාණ්ඩ ප්‍රවාහනය යන දෙකම සිදු කරන ආයතන 32% ක් පැවතිණි. එසේම ජාතික සහ ජාත්‍යන්තර වශයෙන් ව්‍යාප්ත වී ඇති ආයතන සමීක්ෂණය සඳහා ඉලක්ක කළද, එම ආයතනයන් කුලී රථ නියෝජිත ආයතන ලෙස කටයුතු නොකරන බවද තොරතුරු තාක්ෂණ ආයතන ලෙස පවත්වාගෙන යනු ලබන බවද සඳහන් කරමින් සමීක්ෂණය සඳහා තොරතුරු හා දත්ත සැපයීමෙන් වැලකී සිටින ලදි.

## 2-2. සේවා සැපයීමේ වපසරිය




රූප සටහන 02 : සේවා සැපයීමේ වපසරිය

කුලී රථ සේවාව සපයනු ලබන ආයතන අතුරින් දීප ව්‍යාප්තව සේවා සපයන ආයතන වැඩිවශයෙන් ඇති අතර දිස්ත්‍රික් මට්ටමින් සේවාව සපයන ආයතන ඇත්තේ ඉතා අඩු වශයෙනි.

## 2-3. සේවාවේ ස්වභාවය




රූප සටහන 03 : සේවාවේ ස්වභාවය

සමීක්ෂණය සඳහා යොදා ගන්නා ලද සියළුම ආයතන අතරින් 96% ක්ම දවසේ පැය 24 පුරාම සේවාවන් සපයන අතර ආයතන 4% ක පමණ සුළු ප්‍රමාණයක් දිවා කාලයේදී පමණක් සේවය සපයනු ලබයි.

## 2-4. මොබයිල් App පහසුකම් ලබා ගැනීම




රූප සටහන 04 : මොබයිල් App භාවිතය

වර්තමානය වන විට නවීන තාක්ෂණය භාවිතය සීඝ්‍රයෙන් වැඩිවෙමින් පවතී. ඒ අනුව සමීක්ෂණයේදී තොරතුරු ලබා දුන් ආයතන අතුරින් 29% මොබයිල් App භාවිතා කරමින් කුලී රථ සේවාවේ නියැලෙන ආයතන වන අතර ඉතිරි 71% මොබයිල් App භාවිතයෙන් තොරව මෙම ක්ෂේත්‍රයේ සේවාවන් සපයන ආයතන වේ.

## 2-5. ව්‍යාපාරික ප්‍රචාරණ මාධ්‍ය




රූප සටහන 05 :  භාවිතා කරනු ලබන ප්‍රචාරණ මාධ්‍ය

සමාජ මාධ්‍ය ජාලය ප්‍රචාරණ මාධ්‍ය ලෙස තෝරා ගෙන ඇති ආයතන වැඩිවශයෙන් ඇති අතර අත් පත්‍රිකා සහ දැන්වීම් පුවරු භාවිතා කරමින් ප්‍රචාරණ කටයුතු සිදු කරන ආයතනද සැලකිය යුතු ප්‍රමාණයක් ඇත. පුවත් පත් දැන්වීම් මඟින් හෝ වෙනත් ආකාරයෙන් ප්‍රචාරණ කටයුතු සිදු කරනු ලබන ආයතන සීමිත සංඛ්‍යාවක් පවතී.

## 2-6. ආයතනය සතු වාහන පිළිබඳ තොරතුරු

කුලී රථ නියෝජිත ආයතන සතුව පවතින වාහන පිළිබඳව කල විමසීමේදී, ඇතැම් ආයතනවල අයිතිය සතු වාහන නොමැති බවද කුලී පදනම මත ලියාපදිංචි කර හෝ මොබයිල් App මගින් ලියාපදිංචි කරන ලද වාහන විශාල සංඛ්‍යාවක් ඇති බවද පැහැදිලි විය. මෙහිදී ඇතැම් නියෝජිත ආයතන තමන් සතු හෝ කුලී පදනම මත ලියාපදිංචි කර ගන්නා හෝ වාහන පිළිබඳ දත්ත හා තොරතුරු ප්‍රකාශ කර සිටියද ව්‍යාපාරික තරඟකාරිත්වය හේතුවෙන් බොහෝ ආයතන නිවැරදි තොරතුරු සැපීමට අකමැත්ත ප්‍රකාශ කිරීම නිසා නිවැරදි ඇස්තමේන්තු ගණනය කිරීම අපහසු කරුණක් විය.

## 3 පරිච්ඡේදය

### 3-1. මානව සම්පත් උපයෝජනය

තනතුරෙහි ස්වභාවය සහ වැටුප් දීමනා පිළිබඳ සමීක්ෂණය තුළින් සිදුකරන ලද ප්‍රශ්න කිරීමේදී කුලී රථ සේවාව සඳහා යොදා ගනු ලබන තනතුරු ලෙස රියදුරු සහ රිය සහයක වශයෙන් සිටින අතර අනෙකුත් තනතුරු ආයතනික පරිපාලන කටයුතු සහ තාක්ෂණික නිලධාරීන් ලෙස කටයුතු කරන බව ප්‍රකාශ වූ අතර මහා පරිමාණ වශයෙන් ක්‍රියාත්මක වන ආයතන කිහිපයක හැරුණ විට අනිකුත් බොහෝ ආයතන තනි පුද්ගලයෙකු විසින් නිවසේ පවත්වා ගෙන යනු ලබන ආයතන වේ. එසේම තනි පුද්ගලයකු විසින් පවත්වාගෙන යනු ලබන පුද්ගලයන් දෙදෙනෙකු, තිදෙනෙකු හෝ ඊට වැඩි කිහිපදෙනෙකු සේවයේ යොදවා ගනිමින් පවත්වාගෙන යන ආයතන ද අනාවරණය විය.

### 3-2. බඳවා ගැනීම් ක්‍රමවේද




රූප සටහන 06 : භාවිතා කරනු ලබන ප්‍රචාරණ මාධ්‍ය

මෙම ආයතනයන්හි පුරප්පාඩු පිරවීමේදී වැඩි වශයෙන් අනුගමනය කරන ක්‍රමවේදය වන්නේ අන්තර්ජාල දැන්වීම් භාවිතයයි. මාධ්‍ය දැන්වීම් හා පුද්ගලික සම්බන්ධතා මත බඳවා ගැනීම්ද සාපේක්ෂ වශයෙන් ඉහල මට්ටමක පවතින අතර මිනිස්බල නියෝජිත ආයතන හා වෙනත් ක්‍රම මඟින් බඳවා ගැනීම් සිදුකිරීම ඉතා පහල මට්ටමක පවතී.

## 3-3. සේවකයන් වෙත ලබාදෙන දීමනා හා වරප්‍රසාද

මෙහිදී අප විසින් ඉදිරිපත් කරන ලද  නිර්ණායකයන් සඳහා ලැබුණු ප්‍රතිචාර පහත පරිදි වේ.

| නිර්ණායක | පරිපාලන/තොරතුරු තාක්ෂණ  කාර්ය සේවකයින් සඳහා ප්‍රතිලාභ ලබා දෙන ආයතන ප්‍රතිශතය | කුලී රථ සේවකයින් සඳහා ප්‍රතිලාභ ලබා දෙන ආයතන ප්‍රතිශතය |
|---|---|---|
| 01. සේවකයින් ස්ථිර කිරීම | 29% | 0 |
| 02. EPF/ETF ගෙවීම | 17% | 0 |
| 03. අතිකාල දීමනා ගෙවීම් | 21% | 0 ප්‍රමාණවත් |
| 04. සේවක වන්දි ලබාදීම සම්බන්ධ ක්‍රියාමාර්ග | 54% | 0 තොරතුරු ලබා දී |
| 05. සේවක පාරිතෝෂිත ගෙවීම් | 07% | 0 නැත |
| 06. වෘත්තීය සමිති ක්‍රියාකාරිත්වය | 0 | 0 |
| 07. සේවය හැරයාමේ ක්‍රමවේදය | 01% | 01% |
| 08. කාන්තාවන් සේවා නියුක්ත කර වීමේ නීති | 0 | 0 ප්‍රමාණවත් |
| 09. ආයතනය වෘත්තිය සංගමයක සමාජිකත්වය | 0 | 0 තොරතුරු ලබා දී |
| 10. ආයතනය තුල සේවක සුභසාධක සංගම් ක්‍රියාකාරිත්වය | 0 | 0 නැත |

ඒ අනුව ආයතන විසින් තොරතුරු ලබා දීමේ දී පරිපාලන හා තොරතුරු තාක්ෂණ කාර්ය සේවකයින් පිළිබඳ පමණක් තොරතුරු ලබා දීමට ක්‍රියාකරන ලද අතර කුලී රථ සේවකයින් සම්බන්ධයෙන් එම නිර්ණායකයන් සඳහා තොරතුරු ලබා දීමට හැකියාවක් නොමැති බව සඳහන් කරන ලදි. එයට ප්‍රධාන හේතුව ලෙස එම ආයතන දක්වා සිටියේ කුලී රථ සේවාව සඳහා කුලී රථ හා රියදුරන් සම්බන්ධ කරගනු ලබන්නේ කුලී පදනම මත කොමිස් මුදල් ගෙවීමේ කොන්දේසිය අනුව බවයි.  ඒ අනුව සමීක්ෂණයේදී  දීමනා හා වරප්‍රසාද පිළිබඳව කරන ලද විමසීම් වලදී ආයතන විසින් දක්වන ලද ප්‍රතිචාර ප්‍රතිශත වශයෙන් ඉහත වගුවේ සඳහන් කර ඇත.

# 4 පරිච්ඡේදය

## 4-1. විවරණය

- මෙම සමීක්ෂණයට අනුව කුලීරථ නියෝජිත ආයතන විශාල සංඛාවක් පැවතියද වැඩි සේවක සංඛ්‍යාවක් සහිතව මහා පරිමාණ වශයෙන් පවත්වාගෙන යනු ලබන ආයතන ඇත්තේ ඉතා අඩුවෙන් බව පැහැදිලි විය. අනිකුත් ආයතන තනි පුද්ගල හෝ පුද්ගලයින් කිහිප දෙනෙකු සමඟ පවත්වාගෙන යනු ලබන ආයතන වන අතර ඇතැම් ආයතන කාර්යාල ලෙස තම නිවස යොදා ගනිමින් පවුලේ ව්‍යාපාරයක් ලෙස පවත්වාගෙන යනු ලබයි. එසේ වුවද එම බොහෝ ආයතන ලියාපදිංචි කරගෙන ඇති වාහන සංඛ්‍යාව ඉහල අගයක් ගනී. එමඟින් නිරීක්ෂණය වන්නේ එයින් ජනිත වී ඇති වැඩිම රැකියා අවස්ථාවන් වන්නේ රියදුරු රැකියාව බවයි. මහා පරිමාණ වශයෙන් පවත්වාගෙන යන ආයතන තුළින් කුලී රථ සේවාවට සම්බන්ධ සෘජු රැකියා අවස්ථාවන් වන රියදුරු රැකියාවට අමතරව ඒ සම්බන්ධ වක්‍ර රැකියා අවස්ථාවන්වන පරිපාලන කාර්ය සඳහා සහ තොරතුරු තාක්ෂණ කාර්යන් සඳහා ඇති රැකියා අවස්ථාවන් මෙම ක්ෂේත්‍රය තුළට ජනිතවන බව පෙන්වාදිය හැකිය.
- වර්තමානයවන විට තාක්ෂණික මෙවලම් භාවිතය ශීඝ්‍රයෙන් ඉහල යමින් පැවතී. එය බොහෝ ආයතන තොරතුරු ඉදිරිපත් නොකිරීමටද හේතුවන්නට ඇත. එසේම මෙම දියුණු තාක්ෂණය යොදා ගැනීම සහ ප්‍රචාරණ මාධ්‍ය භාවිතය හේතුවෙන් ක්ෂේත්‍රය තුළ ඒකාධිකාරියක් ගොඩනැගී ඇති බව සහ එය කුඩා පරිමාණ ව්‍යාපාරිකයින්ට තර්ජනයක් වී ඇති බව එම ව්‍යාපාරිකයින්ගේ මතය විය.
- ආයතනය පිළිබඳ ප්‍රචාරණ කටයුතු සිදු කිරීමේ දී බොහෝ ආයතන සමාජ මාධ්‍ය ජාලය වැඩි වශයෙන් යොදා ගන්නා අතර ආයතනික පුරප්පාඩු පිරවීමේදී වැඩිවශයෙන් අනුගමනය කරන ක්‍රම වේදය වන්නේ අන්තර්ජාල දැන්වීම් භාවිතයයි. මෙයට ප්‍රධාන වශයෙන් හේතුවිය හැක්කේ ප්‍රචාරණ කටයුතු වලදී සහ පුරප්පාඩු ප්‍රසිද්ධ කිරීමේදී වැඩි පිරිසක් වෙත ඉතා ඉක්මනින් සහ වේගයෙන් ළඟාවිය හැකි මාධ්‍යක් වීම සහ අනිකුත් මාධ්‍ය සඳහා වැඩි පිරවැයක් දැරීමට සිදුවීමය. එසේම මෙම මාධ්‍ය භාවිතයෙන් එම ආයතනවල රැකියා අවස්ථාවන් පිළිබඳ කරුණු විමසීමට හෝ එම ආතයන තුළ වාහන ලියාපදිංචි කිරීමට ද එමඟින් තම අවශ්‍යතා සඳහා වාහන ඇනවුම් කිරීමට ද පාරිභෝගිකයාට හැකියාව ඇත.
- ආයතනය සතු වාහන පිළිබඳ කල විමසීමේදී ඇතැම් ආයතන අයිතිය සතු වාහන නොමැතිව කුලී පදනම මත ලියාපදිංචි කර හෝ මොබයිල් App මගින් ලියාපදිංචි කරන ලද වාහන විශාල සංඛ්‍යාවක් ඇති බව පැහැදිලි විය. මෙහිදී ස්ථිර සංඛ්‍යා ලේඛණ සැපයීමෙන් බොහෝ ආයතන වැලකී සිටින ලදි. එයට හේතු ලෙස ඔවුන් ප්‍රකාශ කර සිටින ලද්දේ ඇතැම් වාහන හිමියන් ලියා පදිංචිය පමණක් ලබා ගත්තද සේවා සැපයීමකින් තොරව එයින් ඉවත් වී යන බවයි. තවද ඇතැම් වාහන හිමියන් වෙනත් රැකියාවක යෙදෙමින් අමතර ආදායම් මාර්ගයක්

වශයෙන් කුලී රථ ලෙස ආයතනය තුල ලියා පදිංචි වුවද ඔවුන්ගේ කැමැත්ත පරිදි කුලී රථ සේවයේ යෙදීම දෛනිකව වෙනස්වන බවද ප්‍රකාශ කරන ලදි.

- මානව සම්පත් කළමණාකරණයේදී සේවකයන් වෙත ලබා දෙන දීමනා සහ වරප්‍රසාද පිළිබඳ කරන විමසීම්වලදී සපයන ලද නිර්ණායකයන් පරිපාලන කටයුතු සඳහා බඳවා ගන්නා නිලධාරීන්ට පමණක් අදාලවන බවද කුලී රථ සේවාවේ යෙදෙන සේවකයන් කුලී පදනම මත සේවයේ යෙදෙන බැවින් එම නිර්ණායකයන් ඒ සඳහා අදාල නොවන බව ද පැහැදිලි විය. කුලී රථ සේවාවේ යෙදෙන්නන් කුලී පදනමෙන් සේවයේ යෙදීම හේතුවෙන් ඔවුනට එම නිර්ණායකයන්හි සඳහන් ස්ථිර කිරීම් සහ අනිකුත් දීමනා වරප්‍රසාද ලබා නොදීම එයට ප්‍රධාන වශයෙන් හේතුවන බව ආයතන හිමියන්ගේ අදහස විය.

## 4-2. නිගමනය හා යෝජනා

- ශ්‍රී ලංකාවේ කුලී රථ කර්මාන්තය තුළ සෘජු රැකියා අවස්ථාවන් ලෙස රියදුරු, රිය සහයක ආදී වශයෙන් තනතුරු කිහිපයක් ක්ෂේත්‍රය තුළ බිහි ඇත. එසේ වුවද වක්‍ර රැකියා අවස්ථාවන් ගණනාවක් ඇති අතර තොරතුරු තාක්ෂණය ආශ්‍රිත රැකියා අවස්ථාවන්, ආයතන හා පිරිස් කළමණාකරණය වැනි විෂය ක්ෂේත්‍රයන්ට අදාල රැකියා අවස්ථාවන් මෙම කර්මාන්තය තුල දක්නට ලැබෙන රැකියා අවස්ථාවන් ලෙස හඳුනාගත හැක. එසේම රැකියාව සඳහා ව්‍යාපාරයක් කිරීමට කැමැත්තෙන් පසුවන පුද්ගලයන් සඳහා මනා තරඟකාරිත්වයකින් යුතුව ආරම්භ කර පවත්වාගෙන යා හැකි සහ එමඟින් තවත් රැකියා අවස්ථා ලබා දීමට හැකි කර්මාන්තයක් ලෙස මෙම කුලී රථ කර්මාන්තය හඳුනා ගන්නා ලදි.
- එසේම තාක්ෂණයේ දියුණුවත් සමඟ එදිනදා ජීවිතයේ බොහෝ අවශ්‍යතා ජංගම දුරකථන ඔස්සේ සිදුකර ගැනීමේ හැකියාව වර්තමානයේ දී උදාවී ඇති අතර ඉහළ තරඟකාරීත්වයක් ඇති ව්‍යාපාර ක්ෂේත්‍රයක්වන කුලී රථ සේවාව තුළට ද මෙම තාක්ෂණය ආගමනය වී තිබේ. තමන් සිටින තැනටම අවශ්‍ය වාහනයක් මිනිත්තු ගණනක් තුලදී ගෙන්වා ගැනීමට හැකිවීම, කෙටිම හා පහසුම ගමන් මාර්ගය හඳුනාගත හැකිවීම වැනි වාසි රැසක් මෙම තාක්ෂණය හමුවේ පාරිභෝගිකයාට ලබාගැනීමේ හැකියාව ඇත. මෙවැනි වාසි රැසක් හිමි වීම නිසා කොළඹ හා තදාසන්න ප්‍රදේශවල මෙම සේවාව ජනප්‍රිය වී තිබේ. නමුත් ඉන් පිට පළාත්වල එම පහසුකම් නොමැති වීම මෙම ක්ෂේත්‍රයේ ඇති ගැටළුවක් වේ. එසේම ජාත්‍යන්තර වශයෙන් විසිරුණු වෙළඳ ව්‍යාපාර ලෙස පවත්වාගෙන යනු ලබන ආයතන ස්ථාපිත වීමත් සමඟ දියුණු තාක්ෂණික ක්‍රමවේදයන් කුලී රථ සේවාවට ආගමනය වී ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස දේශීය වශයෙන් ක්‍රියාත්මක වූ කුඩා ව්යාපාරිකයන්හට විශාල තරගකාරීත්වයකට මුහුණ දීමට සිදු වී තිබේ. ඒ අනුව කුලී රථ සේවාව සඳහා තාක්ෂණය භාවිතය නාගරික මෙන්ම ග්‍රාමීය මට්ටමින් දියුණු කිරීම මෙන්ම කුලී රථ සේවාව තුළ ඒකාධිකාරියක් ඇති වීම වැලැක්වීම සඳහා දේශීය කුඩා ව්‍යාපාරිකයන් දැනුම්වත් කිරීම සහ දිරි ගැන්වීම් කල යුතුය.

- එසේම වර්තමාන ශ්‍රී ලංකාවේ කුලී රථ ප්‍රමාණය ක්‍රමයෙන් වැඩි වෙමින් පවතී. නමුත් මේවා සඳහා වාරණය හෝ පාලනය කිරීම පිළිබඳ නිශ්චිත නිර්ණායක හෝ සීමාවන් නොමැතිකම හේතුවෙන් ඉදිරියේ දී ප්‍රබල ගැටළුවක් බවට පත්විය හැකිය. පොදු ප්‍රවාහනයේ ඇති දුෂ්කරතා හේතුවෙන් කාර්යක්ෂම සේවාවක් සලසා ගැනීම සඳහා කුලී රථවලට මහජනයා යොමු වුවද, එහි අතුරු ප්‍රතිඵලයක් වන්නේ මාර්ග අවහිරතා ඇති වීමය. එවැනි අර්බුදයකට පෙර අවශ්‍ය ක්‍රියාමාර්ග ගතයුතු වේ. එය පරිපාලනය විසින් විසඳිය යුතු කාරණයකි. ඒ සඳහා පොදු ප්‍රවාහන ක්‍රමය දියුණු මට්ටමකට ගෙන ඒම, යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම, ප්‍රවාහන ඉල්ලුම මනා ලෙස කළමනාකරණය කිරීම සහ පරිසරයට හිතකර පාලන ක්‍රමයක් ඇති කිරීම වැනි ක්‍රියාමාර්ග මගින් මෙම තත්වයන් පාලනය කල හැකිවනු ඇත.
- එසේම මෙම සේවාව සැපයීමේදී මිල පිළිබඳ නිශ්චිත සම්මතයක්ද නැත. තාක්ෂණය භාවිතා කරමින් සිදුකරන කුලී රථ සේවාව මෙන්ම මීටර් සවිකර ඇති කුලී රථ සේවා සඳහා ද නිශ්චිත මිල පාලනයක් සහිතව ප්‍රමිතීන් සකස් කළයුතු වේ. එවිට පාරිභෝගික අපහසුතා මෙන්ම අවිධිමත් ලෙස පවතින කුලී රථ සේවාව විධිමත්ව ස්ථාපිත කිරීමටද හැකිවනු ඇත. මේ සඳහා රාජ්‍ය අංශයේ ප්‍රවාහන අමාත්‍යාංශය යටතේ ඇති රාජ්‍ය සහ අර්ධ රාජ්‍ය ආයතනවලට මූලිකත්වය ගෙන ක්‍රියාකිරීමේ හැකියාව පවතී.
- කුලී රථ කර්මාන්තය තුළින් ලබා දෙන සේවාව පිළිබද සේවා දායකයා තෘප්තිමත් වන්නේද යන්න මෙහි දී ඇතිවන තවත් ගැටළුවකි. ඇතැම්විට රියදුරන් හඳුනා නොගන්නාවිට කුලී රථවල ආරක්ෂාව පිළිබඳ ගැටළු ඇති වේ. එසේම රියදුරන්ගේ  හැසිරීම් පාරිභෝගිකයාට හිරිහැරයක් වන අවස්ථා ඇති වීමට ඉඩ ඇත. එම නිසා ඔවුන් සම්බන්ධ ආචාරධර්ම පද්ධතියක් සකස් කලයුතු අතර ඒවා අනුගමනය කිරීම සඳහා රියදුරන් දැනුවත් කිරීම මඟින් පාරිභෝගියාට විශ්වාසදායී සේවාවක් සලසා දිය හැකිය. මේ සඳහා රියදුරන්ට පුහුණුව ලබාදීම වැනි වැඩසටහන් ක්‍රියාත්මක කල හැක. එමඟින් වෘත්තීය පිළිගැනීමකින් තොර රැකියාවක් ලෙස සමාජගතවී ඇති කුලී රථ රියදුරු රැකියාව ඉහළ පිළිගැනීමක් ඇති වෘත්තියක් බවට පත්වනු ඇත.